සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

**තෙවන වාර පරීක්ෂණය**
**மூன்றாம் கால சோதனை - 2026**
**Third Term Test**

| ශ්‍රේණිය / தரம் / Grade | 13 | විෂයය / பாடம் / Subject | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper | II | පැය / மணித்தியாலம் / Hours | 3 |
|---|---|---|---|---|---|---|---|

**උපදෙස් :**
* ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව **40** කි.

1. පුද්ගලයෙකුගේ සමාජ ජීවිතයේ වැදගත්ම හා කේන්ද්‍රීය සාධකය සන්නිවේදනය වන බව බොහෝ විද්වතුන් පැහැදිලි කොට ඇත.
   (i) පුද්ගලයෙකුගේ වාචික සන්නිවේදන ශක්තිය සඳහා හේතුවන කුසලතා **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)
   (ii) පහත දක්වා ඇති සන්නිවේදන මූලිකාංග කෙටියෙන් හඳුන්වන්න.
   (අ) ප්‍රතිපෝෂණය (ආ) අද්දැකීම් පසුතලය (ලකුණු 08)
   (iii) විධිමත් සන්නිවේදනය අවිධිමත් සන්නිවේදනයෙන් වෙනස් වන ආකාර **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 12)
   (iv) නව මාධ්‍ය හා සමාජ මාධ්‍යයන්ට අනුගතව පහත කාර්යයන් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.
   (අ) තොරතුරු සම්පාදනය (ආ) අධ්‍යාපනය
   (ඉ) සම්බන්ධතා ගොඩනැගීම (ඊ) විකල්ප මණ්ඩපය (ලකුණු 16)

2. ශිෂ්‍ය ශිෂ්‍යාවන් මාධ්‍ය සාක්ෂරතාවෙන් යුක්තව විචාරශීලීව මාධ්‍ය පරිහරණය කිරීමට යොමු කළ යුතුව ඇත.
   (i) මාධ්‍ය සාක්ෂරතාව තුළ ගොඩනැගෙන සමත්කම් ලෙස, ඇමෙරිකානු ජාතික මාධ්‍ය සාක්ෂරතා ආයතනය හඳුන්වා දී ඇති සමත්කම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)
   (ii) සාම්ප්‍රදායික මාධ්‍ය සතු වැදගත්කම් **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)
   (iii) රූපවාහිනී මාධ්‍ය හා සිනමා මාධ්‍ය අතර ඇති වෙනස්කම් **තුනක්** සන්සන්දනාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 12)
   (iv) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘතිය සහ ඔස්ගුඩ් ශ්‍රාම් ආකෘතිය අතර දැකිය හැකි වෙනස්කම් **හතරක්** සන්සන්දනය කරමින් සාකච්ඡා කරන්න. (ලකුණු 16)

3. අන්තර් පුද්ගල සබඳතා ගොඩනගා ගැනීම සඳහා සෑම පුද්ගලයකුටම සන්නිවේදනය අත්‍යවශ්‍ය වේ.
   (i) සන්නිවේදනය පිළිබඳ විල්බර් ශ්‍රාම්ගේ නිර්වචනය ලියන්න. (ලකුණු 04)
   (ii) අන්තර් පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජන **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)
   (iii) සමාජ මාධ්‍ය මඟින් සිදුවිය හැකි ධනාත්මක බලපෑම් **තුනක්** උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 12)
   (iv) මාධ්‍ය අභිසාරිතාව ජනමාධ්‍ය මෙන්ම එහි ග්‍රාහක ස්වභාවයන්ද වෙනස්කිරීමට හේතු වී ඇත. කරුණු **හතරක්** පදනම් කොටගෙන පුවත්පතකට වචන 250 නොඅඩු ලිපියක් සකස් කරන්න. (ලකුණු 16)

4. සිසු කුසලතා ගොඩනැගීම හා පාසලේ ප්‍රතිරූපය ප්‍රවර්ධනය සඳහා සන්නිවේදන ශක්‍යතා නිවැරදි සැලසුමකට අනුව යොදා ගැනීමේ වැදගත්කම විදුහල්පතිවරයා අවධාරණය කළේය.

(i) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ජන මාධ්‍ය මගින් ඉටු කළ යුතු යැයි දක්වා ඇති කාර්ය **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) පාසලේ ප්‍රතිරූපය ගොඩනැගීමට සමාජ මාධ්‍ය යොදාගත හැකි ආකාර **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ඔබ ටෙලි නාට්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන්නේ නම්, එහිදී තම කාර්යය සාර්ථක කර ගැනීමට දායකත්වය ලබාගත යුතු ශිල්පීන් **සිව් දෙනකු** නම් කර, ඉන් **දෙදෙනෙකු** සිදු කළ යුතු කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) මාධ්‍ය නියාමන ප්‍රවේශ **හතරක්** විස්තර කරන්න. (ලකුණු 16)

5. මාධ්‍ය ප්‍රවණතාවල අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධයක් පවතී.

(i) පුද්ගලයා මාධ්‍ය සාක්ෂරතාවෙන් යුක්ත අයෙකුබවට පත්කරලීමේ ක්‍රියාවලිය නම් කරන්න. (ලකුණු 04)

(ii) ගෝලීයකරණය නිසා ගොඩනැගී ඇති සමාජ ප්‍රවණතා **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 08)

(iii) සමීක්ෂණයක් සඳහා අවශ්‍ය දත්ත රැස්කර ගැනීමට සම්මුඛ සාකච්ඡාවක් සිදුකිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)

(iv) සංවර්ධනය සඳහා සන්නිවේදන සංකල්පයට අදාළව පහත කරුණු පැහැදිලි කරන්න.

(අ) ජනතා කේන්ද්‍රීයතාව.

(ආ) සමාජීය සම්බන්ධතා හා සමානාත්මතා ගොඩ නැඟීම. (ලකුණු 16)

6. සන්නිවේදනය හා සාම්ප්‍රදායික සමාජය අතර අවියෝජනීයභාවයක් පවතී.

(i) මාධ්‍ය සංස්කෘතිය සමකාලීන සමාජයේ ඉටුකරන කාර්යයන් **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) රූපවාහිනී මාධ්‍ය සඳහා භාෂාව යොදා ගැනීමේදී අවධානය යොමු කළ යුතු කරුණු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 08)

(iii) විචාරශීලී ග්‍රාහකත්වය කෙරෙහි බලපාන සාධක **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)

(iv) නිවාසාන්තර ක්‍රීඩා උළෙළෙහි සංවිධායකවරයෙකු වශයෙන් ඔබ පත්කොට ඇත.

(A) ක්‍රීඩා උළෙළෙහි සාර්ථකත්වය සඳහා සිද්ධි කළමනාකරණය අවශ්‍ය වන හේතු **දෙකක්** හඳුන්වන්න.

(B) මහජන සම්බන්ධතා නිලධාරියෙකු සතුව පැවතිය යුතු කුසලතා **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 16)

7. (i) සිල්වියෝ වයිස්බෝඩ් සංවර්ධනය සඳහා සන්නිවේදනයේ ප්‍රායෝගිකභාවය සම්බන්ධයෙන් දක්වා ඇති අදහස් **දෙකක්** ලියන්න. (ලකුණු 04)

(ii) රටක විධිමත් සන්නිවේදන ප්‍රතිපත්ති මාලාවක් පැවතීම වැදගත්වන ආකාර **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 08)

(iii) මහජන සම්බන්ධතා අවශ්‍ය වන අවස්ථා **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) ගෝලීය සංස්කෘතිය මගින් දේශීය සංස්කෘතිය වෙනස්කම්වලට ලක් කොට ඇති ආකාරය කරුණු **හතරක්** මගින් පැහැදිලි කරන්න. (ලකුණු 16)